ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**External Degrees and Extension Courses Unit**

# සිහිකැඳවීමයි

2025/07/29 දිනැති දැනුම් දීම අනුව 2015 අධ්‍යයන වර්ෂයේ සිට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ලියාපදිංචි සියලු සිසුන්ගේ අධ්‍යයන කටයුතු පහසු කර ගැනීමට අවශ්‍ය ශිෂ්‍ය තොරතුරු ගොනුව **(Student Profile)** සකස් කර ගැනීම අනිවාර්යය වේ. ඒ අනුව ලියාපදිංචි වන අවස්ථාවේ ලබා දී ඇති දුරකථන අංකයෙහි වෙනසක් සිදුව ඇත්නම් ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා සංශෝධනය කරගන්නා ලෙසද දන්වමි.

මෙම ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) සාදා ගන්නා ආකාරය පිලිබඳව zoom තාක්ෂණය ඔස්සේ 2025/08/04 දින සිට 2025/08/15 දින දක්වා රැස්වීම් වාර ගණනාවක් පවත්වා දැනුවත් කිරීම් සිදුකර ඇතත් තවමත් සිසුන් විශාල ප්‍රමාණයක් එම කාර්යය සම්පූර්ණ කර නොමැත.

ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) සාදාගන්නා ආකාරය පියවරෙන් පියවර දැක්වෙන වීඩියෝව වෙබ් අඩවියේ පලකර ඇති අතර, ඒ අනුව ඔබට අදාළ ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) 2025.09.15 දිනට පෙර සකස් කර ගන්නා ලෙස දන්වමි.

ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා තොරතුරු සන්නිවේදනයේ ආරම්භයක් ලෙස 2023 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණයේ (2022/2021/2020/2019/2018/2017/2015 පුනර්) ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා වන අයදුම්පත (Re-correction Application) ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) ඔස්සේ ලබාගැනීමට කටයුතු සිදුකර ඇති අතර ඉදිරියේදී පහත සඳහන් තොරතුරු ද ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) ඔස්සේ සිදුකරනු ලැබේ.

1. 2024 වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණයේ (2023/2022/2021/2020/ 2019/2018 පුනර්) විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම.
2. 2024 විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි I පරීක්ෂණයේ (2023/2022/2021/2020/2019/2018/2017 පුනර්) විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම.
3. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයේ (2023/2022/2021/2020/2019 පුනර්) සහ ශාස්ත්‍රවේදී මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයේ (2018/2017/2015 පුනර්) අයදුම් පත්‍රය නිකුත් කිරීම.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025.09.04

**විමසීම්**: 0113485404 (රාජකාරී වේලාවන්හි පමණි.)